# ‘සිතුවිලි සිත්තම්’ සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය

## ලෝක ළමා දින සැමරුම - 2024

2024 ඔක්තෝබර් මස 01 වැනිදාට යෙදෙන ලෝක ළමා දිනය නිමිති කර ගනිමින් සමස්ත ලංකා මට්ටමින් චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟයක් පැවැත්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තීරණය කර ඇත. මෙම තරඟය අංශ දෙකක් ඔස්සේ පැවැත්වේ.

| පාසල් අංශය - (රජයේ පාසල්, පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, පිරිවෙන්) | |
|---|---|
| **1. කාණ්ඩය**<br>(1 ශ්‍රේණිය)<br><br>මෙම කාණ්ඩයට එවිය හැක්කේ **චිත්‍ර පමණයි.**<br><br>**තේමාව - මම සහ මගේ පවුල** | **මාතෘකා**<br>1. මම සහ මගේ පවුල<br>2. මගේ යාළුවෝ<br>3. මගේ පාසල |
| **2. කාණ්ඩය**<br>(2 - 3 ශ්‍රේණි)<br><br>මෙම කාණ්ඩයට එවිය හැක්කේ **චිත්‍ර පමණයි.**<br><br>**තේමාව - මගේ පරිසරය** | **මාතෘකා**<br>1. පරිසරයට මම ආදරෙයි<br>2. අපේ ගම/නගරය මම දකින හැටි<br>3. අපේ රටේ අපි දක්ෂයි |
| **3. කාණ්ඩය**<br>(4 - 5 ශ්‍රේණි)<br><br>මෙම කාණ්ඩයට එවිය හැක්කේ **චිත්‍ර පමණයි.**<br><br>**තේමාව - පුංචි අපි සහ අපේ සතුට** | **මාතෘකා**<br>1. පුංචි අපි සහ අපේ සතුට<br>2. මම දඬුවමට අකමැතියි<br>3. අපේ යාළුවන්ට උදව් කරමු. සතුටු වෙමු |

| | |
|---|---|
| **4. කාණ්ඩය**<br>(6 - 8 ශ්‍රේණි)<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර හා පෝස්ටර් පමණක්** එවිය හැකිය.<br><br>**තේමාව - අන්තර්ජාලය හා අපි** | **මාතෘකා**<br>1. අන්තර්ජාලය යහපතට යොදාගමු.<br>2. අන්තර්ජාලය අපට කරන බලපෑම<br>3. අන්තර්ජාලය සහ ලෝකය |
| **5. කාණ්ඩය**<br>(9 - 11 ශ්‍රේණිය)<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර හා පෝස්ටර් පමණක්** එවිය හැකිය.<br><br>**තේමාව - ළමා අයිතිවාසිකම් සහ යුතුකම්** | **මාතෘකා**<br>1. යුතුකම් ඉටු කරමු. යහපත් ළමයෙක් වෙමු.<br>2. යහපත් ළමයෙක් ලොව ගොඩනගයි<br>3. මගේ ඇසින් ළමා අයිතිවාසිකම්<br>(ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙන් එක් ළමා අයිතිවාසිකමක් තෝරාගෙන නිර්මාණය කරන්න.) |
| **6. කාණ්ඩය**<br>(12 - 13 ශ්‍රේණිය)<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර හා පෝස්ටර් පමණක්** එවිය හැකිය.<br><br>**තේමාව - ළමා අපචාර සහ ළමා අපයෝජනය** | **මාතෘකා**<br>1. ලිංගික අපයෝජන නවතමු<br>2. 1929 ළමා උපකාරක දුරකතන සේවය සහ ළමා ආරක්ෂාව<br>3. ළමා ශ්‍රමය නවතමු<br>4. ළමා අපයෝජන සහ ළමා අපි |
| **7. කාණ්ඩය**<br><br>**මෙම කාණ්ඩය විශේෂ අවශ්‍යතා ඇති ළමයින් සඳහා පමණි ( වයස අවුරුදු 18ට අඩු )**<br><br>මෙම කාණ්ඩයට එවිය හැක්කේ **චිත්‍ර පමණයි.**<br><br>**තේමාව - අපි දක්ෂයි. අපිට පුළුවන්** | **මාතෘකා**<br>1. මම සහ මගේ පවුල<br>2. මගේ යාළුවෝ මට ශක්තියක්<br>3. අපි විවිධයි. අපිට පුළුවන් |

| විවෘත අංශය | |
|---|---|
| **8. කාණ්ඩය**<br>**ගුරුවරුන් -**<br><br>**(රජයේ පාසල්, පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, පෙර පාසල්, දහම් පාසල්, පිරිවෙන්)**<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර, පෝස්ටර් හා කාටූන්** යන අංශ 3න්ම නිර්මාණ එවිය හැකිය.<br><br>**තේමාව - ළමා ආරක්ෂාවේ ගුරු භූමිකාව** | **මාතෘකා**<br>1. ගුරුවරයා සහ ළමා ආරක්ෂාව<br>2. ළමා ලොව විනාශ කරන මානසික හිංසනය<br>3. ළමා අපයෝජන ගැන විමසිලිමත් වෙමු.<br>4. දඬුවම නොව, යහපත් වචන ළමයා ගොඩනගයි |
| **9. කාණ්ඩය**<br><br>**(විශ්වවිද්‍යාල සිසුන් හා උසස් අධ්‍යාපන ආයතන සිසුන්)**<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර, පෝස්ටර් හා කාටූන්** යන අංශ 3න්ම නිර්මාණ එවිය හැකිය.<br><br>**තේමාව - ළමා ආරක්ෂාවේදී තරුණ අපේ භූමිකාව** | **මාතෘකා**<br>1. ළමා ආරක්ෂාවේ තරුණ අපේ වගකීම<br>2. සෑම ළමයෙකුටම ආදරණීය පවුලක්<br>3. මාධ්‍ය ළමා ලොවට කරන බලපෑම<br>4. සමාජ මාධ්‍ය සහ ළමයා<br>5. මගේ ඇසින් ළමා ආරක්ෂාව |
| **10. කාණ්ඩය**<br><br>**වෘත්තිකයන් හා වෙනත්...**<br><br>මෙම කාණ්ඩයට **චිත්‍ර, පෝස්ටර් හා කාටූන්** යන අංශ 3න්ම නිර්මාණ එවිය හැකිය.<br><br>**තේමාව - ළමයා ආරක්ෂා කිරීම සමාජ වගකීමකි** | **මාතෘකා**<br>1. ළමා ලොව සතුටින් පුරවමු<br>2. පවුලේ වගකීම සහ සුරක්ෂිත ළමා පරපුරක්<br>3. විශේෂ අවශ්‍යතා ඇති ළමයින් අපේමය<br>4. ළමා ලොව සහ වත්මන් අභියෝග<br>5. ළමා අපයෝජන ගැන විමසිලිමත් වෙමු |

- **1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය** දක්වා පාසල් සිසුන් සඳහා **චිත්‍ර අංශයෙන් පමණක්** නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- **6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය** දක්වා පාසල් සිසුන් සඳහා **චිත්‍ර හා පෝස්ටර්** යන අංශයන්ගෙන් පමණක් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- **විශේෂ අවශ්‍යතා ඇති දරුවන්** සඳහා වන කාණ්ඩය (7 කාණ්ඩය) සඳහා **චිත්‍ර අංශයෙන් පමණක්** නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- **විවෘත අංශයේ සියළුම කාණ්ඩයන්** සඳහා **චිත්‍ර, පෝස්ටර් හා කාටූන් යන අංශ 3න්ම** නිර්මාණ එවිය හැකිය.
- මෙම නිර්මාණ ඕනෑම මාධ්‍යයක් ඔස්සේ ඉදිරිපත් කළ හැකිය. (පැස්ටල්, දිය සායම් වැනි...)
- කඩදාසියේ ප්‍රමාණය A4 වේ.
- නිර්මාණ භාර ගන්නා අවසාන දිනය 2024 අප්‍රේල් 10 දින වන අතර, ඒවා තැපැලෙන් එවීම හෝ නැතිනම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙනවිත් භාරදීම සිදුකළ යුතුය.
- ඊට අමතරව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී මහත්ම මහත්මීන් වෙත හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී මහත්ම මහත්මීන් වෙත ගෙනවිත් භාරදීම සිදුකළ හැකිය.
- නිර්මාණය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 1) තරඟයේ නම, 2) තරඟ අංශය හා 3) තරඟ කාණ්ඩය සඳහන් කළයුතුය.
- **එක් තරඟකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අංශයකින් එක් නිර්මාණයක් පමණි.**
- නිර්මාණ එවීමේදී මීට පෙර වෙනත් කවුරුන් විසින් හෝ අඳින ලද නිර්මාණයක් පිටපත් කර එවීම හෝ වෙනත් අයෙකු ලවා අන්දවා එවීම නොකළයුතුය. එවැනි අවස්ථාවක් අනාවරණය වූ ඕනෑම අවස්ථාවකදී එම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.
- තරඟය සම්බන්ධව විනිශ්චය මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වන අතර, අදාළ කොන්දේසි සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් තරඟයෙන් ඉවත් කෙරේ.
- සමස්ත ලංකා ජයග්‍රාහකයන්ට

  ප්‍රථම ස්ථාන සඳහා - කුසලාන, පදක්කම්, ත්‍යාග හා සහතිකපත් ද

  දෙවන හා තෙවන ස්ථාන සඳහා - පදක්කම්, ත්‍යාග හා සහතිකපත් ද පිරිනැමේ.
- දිස්ත්‍රික් ජයග්‍රාහකයන්ට

  ප්‍රථම ස්ථාන සඳහා - පදක්කම්, ත්‍යාග හා සහතිකපත් ද

  දෙවන හා තෙවන ස්ථාන සඳහා - ත්‍යාග හා සහතිකපත් ද පිරිනැමේ.
- මෙම තරඟයට ඉදිරිපත් කරනු ලබන නිර්මාණ අතරින් ජයග්‍රාහී නිර්මාණ සහ තෝරාගනු ලබන නිර්මාණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ඉදිරියේදී මුද්‍රණය කරනු ලබන ප්‍රකාශනයන් සඳහා භාවිත කරන අතර, එම ජයග්‍රාහී නාම ලේඛනය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියෙහි **(www.childprotection.gov.lk)** පළ කෙරේ.
- තරඟය පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය වෙතොත්, පහත සඳහන් දුරකථන අංකයන් ඇමතීමෙන් තොරතුරු ලබාගත හැකිය. (සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා කාලය තුළ)

  **පාසල් අංශය (සිංහල මාධ්‍ය විමසීම්)** - ධනුෂ්ක සේනාරත්න - 0715 789 775

  **විවෘත අංශය (සිංහල මාධ්‍ය විමසීම්)** - ධනුෂ්ක සේනාරත්න - 0715 789 775

  **පාසල් අංශය (දෙමළ මාධ්‍ය විමසීම්)** - පී. එම්. අසාම් - 0758 539 528 / ආර්. රවිරාජ් - 0779 231 583

  **විවෘත අංශය (දෙමළ මාධ්‍ය විමසීම්)** - ආර්. රවිරාජ් - 0779 231 583 / පී. එම්. අසාම් - 0758 539 528

  **වෙනත් විමසීම්** - මාධ්‍ය ඒකකය - 0115 759 965
- **පාසල් අංශය** යටතේ හා **විවෘත අංශය** යටතේ නිර්මාණ ඉදිරිපත් කරන තරඟ කරුවන් සියළු දෙනාම පහත සඳහන් ආකෘතිය පරිදි, තමන් විසින්ම සකසන ලද අයදුම් පත්‍රයක් නිර්මාණය සමග එවියයුතුය.
- අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී, ඔබගේ **මව් භාෂාවෙන්** (සිංහල / දෙමළ) **සහ ඉංග්‍රීසි භාෂාවෙන් අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.**

**"සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය - 2024" - අයදුම් පත්‍රය**

අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී, ඔබගේ මව් භාෂාවෙන් ( සිංහල / දෙමළ) සහ **ඉංග්‍රීසි භාෂාවෙන්** අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම **අනිවාර්ය වේ.**

1. තරඟකරුගේ සම්පූර්ණ නම (සහතිකයේ සඳහන් වියයුතු පරිදි)
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
2. ලිපිනය :- ..............................................................................
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
3. දුරකතන අංකය :- ..............................................................................
4. තරඟ අංශය
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
5. තරඟ කාණ්ඩය
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
6. චිත්‍රයේ මාතෘකාව
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
7. නිර්මාණයේ වර්ගය
   චිත්‍ර / පෝස්ටර් / කාටූන් :- ..............................................................................
8. පාසලේ නම
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
9. ශ්‍රේණිය (පාසල් අංශයට පමණි)
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :- ..............................................................................
10. දිස්ත්‍රික්කය
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :-..............................................................................
11. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
   සිංහල / දෙමළ :- ..............................................................................
   ඉංග්‍රීසි **(අනිවාර්ය වේ)** :-..............................................................................

මෙම නිර්මාණය මා විසින්ම අඳින ලද නිර්මාණයක් බව සහතික කරමි.

දිනය :- අත්සන :-

**නිර්මාණ එවියයුතු ලිපිනය:-**
**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
තැ.පෙ 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.

**සංවිධානය**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**